පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

9 **ශ්‍රේණිය** පුරවැසි අධ්‍යාපනය 2025

II වාර පරීක්ෂණය - පිළිතුරු පත්‍රය

**I කොටස**

| | |
|---|---|
| 01. II | 11. රොබට් ඕවන් |
| 02. IV | 12. පුරපති |
| 03. III | 13. සෘජු |
| 04. III | 14. ජපන් |
| 05. II | 15. ස්විස්ටර්ලන්තය |
| 06. (✓) | 16. (D) |
| 07. (×) | 17. (A) |
| 08. (×) | 18. (B) |
| 09. (×) | 19. (E) |
| 10. (✓) | 20. (C) |

**II කොටස**

**01. I.**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය
- අපරාධ නීතිය
- සිවිල් නීතිය

II.

- අධිකාරී බලය පදනම් කරගෙන රජය විසින් පනවනු ලැබීම.
- මිනිසාගේ බාහිර හැසිරීම් හා ක්‍රියාකාරකම් පාලනය කිරීම.
- නීති කඩ කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් වීම.
- පොදුවේ සමාජ යහපත අරමුණු කරගෙන පනවා තිබීම (පෙළපොතේ තවදුරටත් කරුණු දක්වා ඇත.)

III.

- ඉහලම අධිකරණය - ශ්‍රේෂ්ඨාධිකරණය
- පහලම - මහේස්ත්‍රාත් අධිකරණය

<u>**යුතුකම් හා වගකීම් -**</u>

- අධිකරණ ක්‍රියාවලියට බාධා නොකර ඒ කෙරෙහි විශ්වාසය ගොඩ නැගීම
- අධිකරණයට අපහාස වන අන්දමේ ක්‍රියාවලින් වැලකීම.
- විනිසුරුවන්ට ගරු කිරීම.

(තවත් කරුණු පෙළ පොතේ දක්වා ඇත.)

**02.** I.

- රටක පවත්නා සමාජ ආර්ථික හා සංස්කෘතික පාරිසරික රටාවට ගැළපෙන පරිදි තාක්ෂණය යොදා ගැනීම. යෝග්‍ය තාක්ෂණය ලෙස හැඳින්වේ.

II.

- සම්පත් අපතේ යාම වැලකීම.
- ශ්‍රම සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම
- පරිසර හානිය අවම වීම.
- පාරසරික තුල්‍යතාව රැකගත හැකි වීම.
- රටේ ආර්ථිකයට දරා ගත හැකි වීම.

III.

- මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම.
- අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම.
- මිනිසුන් යාන්ත්‍රිකරණය වීම.
- සමාජය සංකීර්ණ වීම.
- පරිසර දූෂණය
- ලෙඩරෝගවලට ගොදුරු වීම. (එක් කරුණක් විස්තර කිරීමට ලකුණු 02 ක් ලබා දෙන්න.)

**03.**

I.

- ජන ගහණය අධික වීම.
- එක් ස්ථානයකට එක්රැස් කිරීමේ අපහසුව
- මිනිසාගේ අවශ්‍යතා සංකීර්ණ වීම.
- වර්තමාන පාලනකටයුතු සංකිර්ණ ස්වභාවයක් ගැනිම.

II.

- සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක කිරිම.
- නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම.
- නිදහස හා සමානාත්මතාවය අයිතිවාසිකම් හිමිවීම.
- බහුතර කැමැත්ත මත තීරණ ගැනීම (සිසුවා ලියා ඇති පිළිතුරු සලකා ළකුණු ලබා දෙන්න)

III.

- විසිරී ඇති මහජන මතය ඒකරාශි කිරීම.
- තම පක්ෂයේ අරමුණු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.
- අනාගත නායකයන් පුහුණු කිරීම.
- ජනතාව දැනුවත් කිරීම (වැඩිදුර කරුණු පෙළපොතේ ඇත. මෙයින් එක් කරුණක් පැහැදිලි කර ඇත්නම් ලකුණු 02 ක් ලබා දෙන්න)

**04.** I.

- කොළඹ, මහනුවර, ගාල්ල

II.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
- වයස අවු.18 සම්පූර්ණ කර තිබීම.
- ඡන්ද හිමි නාමලේඛනයේ නම ඇතුලත් කර තිබීම.
- ඡන්ද ප්‍රකාශ කිරීමට ඇති අයිතිය අහිමි කර නොතිබීම.

III.

- ඡන්දය ප්‍රකාශ කිරීම.
- මැතිවරණ නීතිරීති වලට අවනත වීම.
- ප්‍රචණ්ඩ ක්‍රියාවලින් වැලකීම
- මැතිවරණ නීති ක්‍රියාත්මක කරන්නන්ට සහය දීම (සිසුවා ලියා ඇති කරුණු සලකා ලකුණු ලබා දෙන්න. ඉන් එක් කරුණක් පැහැදිලි කිරීමට ලකුණු දෙකකි.)

**05.** I.

- විවිධ සේවා සමුපකාර සමිති
- සමුපකාර ණය දෙන සමිති
- කෘෂිකාර්මික නිශ්පාධන සමුපකාර සමිති.
- ධීවර සමුපකාර සමිති
- කර්මාන්ත සමුපකාර සමිති

(පෙළපොතේ වැඩිදුර කරුණු ඇත)

II.

- ජනතාවට සේවා සැපයීම සඳහා සමුපකාර ප්‍රාදේශීයව පවත්වා ගැනීම
- ණය දෙන සමිති පවත්වා ගැනීම.
- අවමංගල්‍යය සේවා සැපයීමට දායක  වීම.
- ප්‍රවාහන හා ඉන්ධන සේවා සැපයීම.
- බැංකු සේවා

(පෙළපොතේ වැඩිදුර සේවාවන් දක්වා ඇත)

III.

- පාසල් ලිපි ද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම.
- ආහාර ද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම.
- ක්‍රීඩා උපකරණ පහසු මිලට ලබා ගැනීම.
- නායකත්ව පුහුණුව
- සාමූහික ජීවන රටාවකට හුරු වීම

(සිසුවා ලියාඇති කරුණු සලකා ලකුණු ලබා දෙන්න. ඉන් එක් කරුණක් පැහැදිලි කිරීමට ලකුණු දෙකකි.)

**06.**

I.

- ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා

II.

- සභාව කැඳවීම හා කල් තැබීම
- සභාවේ මුලසුන දැරීම.
- මහජන උපයෝගිතා සේවා සැපයීම.
- පළාත් පාලන ආයතන සතු කටයුතු සංවිධානය

III.

- ජනවාර්ගික තත්වය හා ජනගහණ අනුපාතය
- භූගෝලීය ප්‍රදේශ හා එහි භෞතික ලක්ෂණ
- ජනගහණය හා ජන ගණත්වය
- ආර්ථික සංවර්ධන මට්ටම.

(එකක් පිළිබඳ කරුණු පැහැදිලි කිරීමට ලකුණු 02 ක් ලබා දෙන්න)

**07.**

I.

- නිෂ්පාදනය, බෙදා හැරීම, පරිභෝජනය

II.

හිතකර - වැඩ පහසු වීම,
කාලය ඉතිරි වීම.
සම්පත් නාස්තිය අවම වීම
ඵලදායීතාව වැඩි වීම.
කාර්යක්ෂමතාව වැඩි වීම.
මානව සබඳතා පුළුල් වීම.

අහිතකර - මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම
අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරුවීම
මිනිසුන් යාන්ත්‍රිකරණය වීම
(මීට සමාන පිළිතුරු ලියා ඇත්නම් ළකුණු ලබා දෙන්න)

III.

- රෝග විනිශ්චය
- ප්‍රතිකාර ගැනීම
- ඖෂධ වර්ග නිෂ්පාදනය
- ශෛල්‍යකර්ම සිදුකිරීම

ආදී උදාහරණ දක්වා පැහැදිලි කර තිබේනම් ලකුණු ලබා දෙන්න.